08 වන පිටෙන්

ඉදිරි අසුනේ කෙළවරේ සිටි ආබාධිත තරුණයකු වෙත ගිය දේවගැතිතුමා මේ දරුවා මේ වගේ යාච්ඤාවට මීට කලින් සහභාගි වෙලා තියෙනවද? යනුවෙන් ඔහුගේ පියාගෙන් විමසීය. නෑ දේවගැතිතුමා යනුවෙන් පිළිතුරු දුන් අතර දරුවාට ඇති ආබාධ මොනවා දැයි විමසා සිටියේය. ළමයාට කිසිසේත් ඇවිදීමට නොහැකි බවත් උපතේ සිටම ඔහු ආබාධිතයෙක් බවත් ඔහු ප්‍රකාශ කළේය. ඉන් පසු දරුවාගේ නළල ස්පර්ශ කරමින් විනාඩි 10 ක පමණ යාතිකාවක් කළදේවගැතිතුමා ඇඟට වෙනසක් තේරෙනවා දැයි දරුවාගෙන් ඇසීය. ඇඟට යම් සුවයක් දැනෙන්නේ යැයි ඔහු කීවේය. පියාගේ මුහුණේ සතුට ඉතිරීන. මින් පසු ළඟම ඇති පල්ලියට සෑම ඉරිදා දිනකම ගොස් යාතිකාවලට සම්බන්ධ වන ලෙස ද තවත් මාස හතරකින් පමණ දේවගැතිතුමා මෙවන් විවෘත යාච්ඤාවක් කරන බවද එදිනට පැමිණෙන ලෙස ද කීවේය. මෙලෙස ආබාධිතයන් හතර දෙනකුට යාච්ඤා කිරීමෙන් අනතුරුව ආනන්ද කලින් හමු වූ තරුණයාගේ අවස්ථාව විය. ඔහුගේ පියාගෙන් විස්තර විමසූ දේවගැතිතුමාට කියා සිටියේ කලින් මෙවැනි යාච්ඤා මෙහෙයකට පැමිණි බවත් ඉන්පසු පල්ලියේ යාච්ඤා මෙහෙයන්ට ගිය බවත් ය. ඉතිං කොහොමද? දැන් ළමයට ගුණයක් තියෙනවද? දේවගැතිතුමා විමසීය. එහෙමයි දේවගැතිතුමා ලොකු ගුණයක් තියෙනවා ළමයාගේ පියා කීවේය. හොඳයි එහෙනං අපි මෙයාට සම්පූර්ණ සුවය පතල යාච්ඤා කරමු. විනාඩි 10 ක පමණ යාච්ඤාවෙන් පසුව මේ දරුවා ඇවිද්දවන්න බලන්න යැයි පියාට කීවේය. පුදුමයකි! දරුවා අපහසුවෙන් ඇවිදින්නට පටන් ගත්තේය. මෙයා ස්ටේජ් එකට නග්ගමුකො පියතුමා කීවේය. වේදිකාවේ පියගැට පෙළ දරුවා තනිවම හෙමිහිට නැංගේය.

ඔහුගේ ආරක්ෂාවට දේවගැතිතුමා හා දරුවාගේ පියා දෙපසින් සිටියෝ ය. වේදිකාව මත කිහිප වරක් එහා මෙහා ගිය දරුවා දෙස සියලූම අය විශ්මයෙන් බලා උන්හ.

දරුවාගේ පියාට මයිකෆ්‍රෝනයක් දුන් දේවගැතිතුමා මේ මහත්මයාගේ නම මොකක්ද?

මම විජේපාල යනුවෙන් කෙටි පිළිතුරක් දුන්නේය. මේ දරුව මේ විදියට ඇවිදින්න බැරුව කොච්චර කල්ද? දැනට අවුරුදු දහ අටක්, උපන් දා ඉඳන් ඇවිදින්න බෑ දේවගැතිතුමා පියා කීවේය. හරි දැන් දරුවට මයික් එක දීල අහන්න ඒ දරුවාගෙන් දැන් මොනවද දැනෙන්නෙ කියල දේවගැතිතුමා කීවේය. එයාට කතා කරන්න බෑ දේවගැතිතුමා එයා උපතින්ම ගොළුවෙක් ළමයාගේ පියා කනගාටුවෙන් කීවේය. බලමු දේව කරුණාවෙන් ඒකත් සනීප වෙලා තියෙන්න පුළුවනි, පුතාට දෙන්නකො මයික් එක පුතාගෙ නම මොකක්ද? දේවගැතිතුමා ඉතා කරුණාවෙන් විමසීය. එයට ඔහු හිස වැනුවා පමණකි පිළිතුරු දුන්නේ නැත. මෙසේ කිහිප විටක් එම ප්‍රශ්නයම ඇසූ දේවගැතිතුමා පුතාට කතා කරන්න පුළුවන් පුතා කතා කරන්නකො යැයි කීවේය. එවිට දරුවා



ගොත ගසමින් තමාගේ නම රොෂාන් බව කීවේය. පියාගේ මුහුණේ සතුට උතුරා ගියේය. ඔහුගේ දෑසින් කඳුළු බිඳු කඩා වැටිණ. දැන් ඉතිං පුතත් එක්ක කතා කරන්න යැයි නැවත මයික් එක පියාට දුන්න ද ඉතා හැඟීම්බරව සිටි ඔහුට කතා කරගත නොහැකි විය.

තවත් මෙවන් සුව වූ දරුවන් දෙදෙනෙක් එහි සිටි අතර රංගජීවගේ දරුවාට යාච්ඤා කළත් ඒ අවස්ථාවේ සුවයක් නොලැබිණ. එහෙත් දිගටම පල්ලියේ ඉරිදා යාච්ඤාවන්ට සහභාගි වන්නට රංගජීව තීරණය කළේය. යාච්ඤා මෙහෙය අවසානයේ සියලූ දෙනාම මෝටර් රථයේ නැඟී ආපසු එන්නට පිටත් වූහ. රංගේ එන බදාදා පෝය දවසනේ. මාත් එක්ක ගමනක් යන්න එන්න ඕනේ ආනන්ද කීවේය. ඒ කොහේද මචං රංගජීව ඇසීය. එතනට යන තුරු අහන්න තහනම් ආනන්ද කීය.

හරි හරි උඹත් එක්ක අපායට යන්න වුණත් මං එන්නං රංගජීව තම විශ්වාසය පළ කළේය. ගෙදරට යන තුරුම හැමෝම කතා කළේ දේවගැතිතුමා කරන සේවාව ගැනත් හා එම ආගමේ ඇති විශ්මිත ස්වභාවය ගැනත් ය. ආනන්ද මේ ගැන කිසිවක් කීවේ නැත.

මොකද ආනන්ද කතා නැත්තෙ රංගජීව ඇසීය. මෙයා යථාර්ථවාදියනෙ ඇස් පනාපිට පෙනුණත් පිළිගන්නේ නැහැ. පිළිතුරු දුන්නේ ප්‍රියානි ය.

එම සතියේ බදාදා දින පොහොය දිනයකි. රංගජීව ආනන්දගේ ගෙදරට ආවේ කතා කරගත් ගමන යන්නට ය. ප්‍රියානි ද ගමනට එකතු වන්නට ඇසුව මුත් මේ ගමනට ඔයා ආවෙ නැත්තං හොඳයි යැයි ආනන්ද කීවේය. කි. මී. 40 ක් පමණ දුර පිහිටි තල්පත් යාය ගමේ හන්දිය වෙත යෑමට ඔවුන්ට ගූගල් සිතියම උපකාරී විය. තල්පත්යාය හන්දියේ ඇති තේ සහ සිල්ලර කඩය වෙත ගිය ආනන්ද මුදලාලි මේ හරියෙ මෙන්න මේ අංකෙ තියන ගෙදර කොහෙද තියෙන්නෙ අංකයක් කිව්වට අපට නිච්චියක් නෑ මහත්තයෝ ඔය ගෙදර නම හරි ගෙදර කෙනෙක්ගෙ නම හරි කියන්න ඇහැකිද මහත්තයෝ? මුදලාලි ඇසීය. ගෙදරට කියන්නෙ පහළවත්ත ඒ ගෙදර ඉන්නෙ විජේපාල කියල කෙනෙක් ආනන්ද කීවේය.

ආ විජේ අයියලගෙ ගෙදර, හොයාගන්න හරි ලේසියි මහත්තයො. තව පොඩ්ඩක් දුර ගියාම පන්සල හම්බුවෙනව පන්සල පහුවුණු ගමන්ම ඒ පැත්තට තියෙන අඩි පාර කෙළින්ම විජේ අයියලගෙ ගෙදරට මුදලාලි කීවේය. ඒ ගෙදර ඉන්නව නේද රොෂාන් කියල ළමයෙක් අර මෑතක් වෙන තුරුම ඇවිදින්න බැරුව හිටියෙ ආනන්ද කීය. රොෂාන් කියල අවුරුදු දහ අටක විතර ළමයෙක් ඉන්නව. හැබැයි ඒ ළමයට ඇවිදින්න බැරි කමක් තිබුණෙ නැහැ. අනික මේ පැත්තෙ නං එහෙම ඇවිදින්න බැරි කෙනෙක් නැහැ. මහත්තයල වෙන තැනක් ගැන වෙන්නැති ඔය හොයන්නෙ. මුදලාලි කියත්ම තම දුරකථනයෙන් එදා ගත් ඡායාරූපය පෙන්වා මුදලාලි මම කියන්නෙ මෙන්න මේ දරුව ගැන යැයි කීවේය.

හරි හරි මහත්තය ඔය දරුව තමයි ඒ ළමය හැමදාම හොඳට ඇවිද්දනෙ මුදලාලි කීවේය.

එහෙනං මට වැරදීමක් වෙන්න ඇති කෝකටත් මං ඒ ගෙදරට ගිහිං එන්නංකො කිවූ ආනන්ද ඒ කඩයෙන් විස්කෝතු පෙට්ටියක් හා කෙසෙල් ඇවරියක් ගත්තේ ය.

රොෂාන්ගේ ගෙදරට ආනන්ද හා රංගජීව යන විට මිදුලේ බංකුවක් මත ඔහු පාඩම් කරමින් සිටියේය. ආ... මේ එදා අර යාච්ඤාව සූදානම් කරපු අංකල් නේද? අංකල් මේව මුකුත් අපේ ගෙදර අයට කියන්න එපා රොෂාන් කීවේය. හරි පුතා බය වෙන්න එපා මං මේ ආවෙ ආයෙත් එන්න පුළුවන්ද කියල අහන්න වෙන තැනක තියෙන එහෙකට ආනන්ද යාච්ඤාව සූදානම් කළ කෙනකු සේ පෙනී සිටිමින් ඇසුවේය. කොහොමද අංකල් මගේ රඟපෑම රොෂාන් ඇසීය. ඒක නම් නියමයි ඒකනෙ මං ආයෙත් ඔයා හොයාගෙන ආවේ. ආනන්ද කීවේය. අනේ බෑ අංකල් එදා කවුරු හරි ගමේ කෙනෙක් හිටිය නං මං ඉවරයි. අනෙක මට රුපියල් 20,000/- ක් දෙන්නං කියල දුන්නෙ 2000/- එදා ආපු මගේ යාළුවොත් කිව්ව ආයෙනං එන්නෙ නෑ කියල රොෂාන් කීවේය. එවිට හේනට කුඹුරට සිරුර දිරාගිය කෙසඟ පුද්ගලයෙක් ඉක්මනින් එතැනට ආවේය. මේ මගේ අප්පච්චි රොෂාන් කීවේය. අපි මේ දරුවගෙ ඉස්කෝලෙට අලූතින් ආ ගුරු වරු ළමය නිවාඩු කාලෙ වැඩ කරන හැටි බලන්න ආවෙ එවර ආනන්ද රඟපෑවේය. එන්න මහත්තය ගෙට මේ එළියෙම ඉන්නෙ මට මේ මුදලාලි පණිවුඩේ එවපු ගමන් දුවල ආවෙ. මහත්තයලට තැඹිලි ගෙඩියක් කඩන්නං. ළමයාගේ පියා කීවේය. අනේ එපා අපිට තවත් තැන් කීපෙකට යන්න තියෙනව දෙමිතුරෝ එතැනට සමු දුන්හ. ආනන්දට හා රංගජීවට එදා දේවගැතිවරයා කළ වංචාව හොඳින් අවබෝධ විය. දරුවා සනීප කරගැනීමේ තවත් බලාපොරොත්තුවක් බිඳ වැටුණු රංගජීවගේ සිතට මහත් තෝන්තුවක් දැණින.




**ප්‍රිය පාඨක හිතවතුනි,හිතවතියනි**

සන්නස මාර්තු කළාපයේ සිට ප්‍රවීණ ලේඛක දෙනගම සිරිවර්ධනයන් රචිත සෝවාන් ඵලයට පත්වූ තරුණ හිමි නමකගේ භාවනා සටහන් ලිපි පෙළක් ගෙන එන්නෙමු.

ඉතා සරලව ඔබ වෙත ඉදිරිපත් කෙරෙන මේ ලිපි වල ඇති කරුණු ප්‍රායෝගිකව යොදා ගැනීමෙන් ඔබේ ජීවිතය කෙතරම් ප්‍රීති ජනක වනු
ඇත් දැයි අත් හදා බලනු මැනවි.

සංස්කාරක



**සන්නස ගැන ඔබේ අදහස් අපට ලියන්න.**

Sannasa, Suite 504, 530 Little Collins Street, Melbourne 3000

Via Sannasa Website:
Visit www.sannasa.com.au